සැ. යු. - 2013.03.15 දින පළ වූ අංක 1802 දින පළවූ අංක 1802 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,803 - 2013 මාර්තු 22 වැනි සිකුරාදා - 2013.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 782 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 809 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 817 |


*සැ. යු.*- (i) ශ්‍රී ලංකාවේ ලේඛකයෝ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 දෙසැම්බර් මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පෝද්දල-මීපාවල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථ අධ්‍යාපන සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 දෙසැම්බර් මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත, 2012 දෙසැම්බර් මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අප්‍රේල් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## වත්තල-මාබෝල නගර සභාව

### බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

වත්තල-මාබෝල නගර සභාව තුළ දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ගම්පහ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. වත්තල-මාබෝල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා දැනටමත් වත්තල-මාබෝල නගර සභාවේ කවර හෝ ආකාරයක සේවා නියුක්තියක යෙදී සිටින අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් "වත්තල මාබෝල නගර සභා බල ප්‍රදේශය" තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතු ය.(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත අයෙකු විය යුතු ය.
5. ඉහත ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
6. සේවා අවශ්‍යතාව අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහි දී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මේ නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.
8. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
9. වත්තල මාබෝල නගර සභාවේ දැනටමත් ව්‍යාපෘති/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
10. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
iii. බඳවා ගනු ලබන තැනැත්තන් වසර (03) ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් වේ.
iv. මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් සහ වත්තල මාබෝල නගර සභාවේ ලේකම් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය :-*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක (අංක 08 දක්වා එක් පැත්තක ද අංක 09 සිට ඉදිරියට අනෙක් පැත්තේ ද වනසේ කඩදාසියක දෙපැත්තේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2013.04.15 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, වත්තල මාබෝල නගර සභාව, වත්තල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් මත ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යම් අයදුම්කරුවකු තනතුරු එකකට වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායාස්ථිත පිටපත් අමුණා එවිය යුතු ය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන පොදු සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික,
*(ඇ)* පළපුරුද්ද පිළිබඳ සහතිකය,
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
*(ඉ)* ජාතික හැඳුනුම්පතේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත.

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය. (මෙම සහතිකය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස දෙකකට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු ය.)

*(උ)* වත්තල මාබෝල නගර සභාවේ දැනට ව්‍යාපෘති/කොන්ත්‍රාත් ලෙස සේවය කරන්නේ නම් සේවා සහතිකය.

*පුරප්පාඩු සඳහා තෝරා ගන්නා ක්‍රමය :-*

කිසියම් තනතුරක් සඳහා අවශ්‍ය අවම සුදුසුකම් පවතින බවට, ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතිකවලින් දක්වා ඇති සෑම අයදුම්කරුවෙක්ම සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලබන අතර අවශ්‍යතාව අනුව ප්‍රායෝගික පරීක්ෂණකට ද යොමු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා තැනැත්තන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න වත්තල-මාබෝල නගර සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.

කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතු ය.

මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය වත්තල-මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

ඩී. පී. එච්. සමරවික්‍රම,
ලේකම්,
වත්තල-මාබෝල නගර සභාව.

2013 මාර්තු මස 07 වැනි දින,
වත්තල මාබෝල නගර සභාව.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය මාසික* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | රියදුරු II 'ආ' පන්තිය | 03 | PL-3 2006A-12,470- 10 x 130 -10 x 145- 10 x 160 - 12 x 170 - 18,860 තෙවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 1. අවම වශයෙන් අටවන ශ්‍රේණිය සමත්ව සිටිය යුතුය.<br>2. පුද්ගලික කුලී රථ සහ භාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>3. වාහන රියදුරකු වශයෙන් වසර 3 ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>4. අවම උස අඩි 05 ක් විය යුතුය.<br>5. දිවා සහ රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්තවයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>6. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.<br>7. පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ සහ මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුනතාවය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය මාසික | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | පැස්සුම්කරු | 01 | $PL_2$-2006A 12,470- 10 x 130- 10 x 145 - 10 x 160- 12 x 170- 18,860 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 1. *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br>*(අ)* ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br>*සහ*<br>*(ආ)* අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.<br>(ii). *බාහිර අයදුම්කරුවන්.-*<br>*(අ)* ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br>*සහ*<br>*(ආ)* අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.<br>*වෘත්තීය සුදුසුකම්.-*<br>*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>*හෝ*<br>*(ආ)* කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.<br>*හෝ*<br>*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.<br>*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ(VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ* |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය මාසික | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* පළමුව සුදුසුකම් ලබන අභ්‍යන්තර සේවකයින් අතරින්, අයදුම්පත් කැඳවා පවත්නා පුරප්පාඩු පුරවන අතර එසේ සුදුසුකම් ලබන්නන් නොමැති නම් පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| | කා. කා. ස. III පන්තිය | 01 | PL1-2006A<br>11,730-10 x 120 - 10 x 130 - 10 x 145-12 x 160 - 17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටීම. |
| | කා. කා. ස. II පන්තිය | 01 | PL1-2006A<br>11,730-10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 -17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br>8 ශ්‍රේණිය සමත් වීම හා කාර්යාල සේවක සේවයේ 3 පන්තියේ වසර 6 ක් සම්පූර්ණ වී තිබීම.<br>*බාහිර අයදුම්කරුවන් :*<br>අ.පො.ස. සා/පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* පළමුව සුදුසුකම් ලබන අභ්‍යන්තර සේවකයින් අතුරින් අයදුම්පත් කැඳවා පවත්නා පුරප්පාඩු පුරවන අතර එසේ සුදුසුකම් ලබන්නන් නොමැති නම් පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| | මුරකරු II | 01 | PL1-2006A - 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - 17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br>අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත් වී තිබීම, හා කා. සේ. සේ. iii පන්තියේ වසර 6ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. බාහිර අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 සමත් වී තිබීම. |
| | නගර ශාලා භාරකරු III | 01 | PL1-2006A - 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත් වීම මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* පළමුව සුදුසුකම් ලබන අභ්‍යන්තර සේවකයින් අතරින් අයදුම්පත් කැඳවා පවත්නා පුරප්පාඩු පුරවන අතර එසේ සුදුසුකම් ලබන්නන් නොමැති නම් පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| | සෞඛ්‍ය කම්කරු | 13 | $PL_1$-2006A<br>11,730 - 10 x 120 -10 x 130- 10 x 145 -12 x 160 -17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය මාසික* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | වැඩ කම්කරු | 03 | $PL_1$-2006A<br>11,730- 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 -17,600 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය (6 වසර) සමත් වී තිබීම. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* පලමුව සුදුසුකම් ලබන අභ්‍යන්තර සේවකයින් අතුරින් අයදුම්පත් කැඳවා පවත්නා පුරප්පාඩු පුරවන අතර එසේ සුදුසුකම් ලබන්නන් නොමැති නම් පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| | ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | $PL_2$-2006A<br>12,470 - 10 x 130- 10 x 145 - 10 x 160 - 12 x170 - 18,860 හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන්.-*<br>ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහිතක පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා./පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/ වානිජ්‍ය අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. නැතහොත් ජාතික පොදු සහතික විභාගයෙන් එකම වතාවක දී ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br>*හා*<br>වසර 05 කට නොඅඩු කාලයක් ඖෂධ සංයෝජක තනතුරක වැඩ බලා තිබීම හෝ රාජකාරි ආවරණය කර තිබීම.<br>*හෝ*<br>අට වන ශ්‍රේණිය සමත් වී තිබීම.<br>*හා*<br>වසර 10 කට නොඅඩු කාලයක් ඖෂධ සංයෝජක තනතුරක වැඩ බලා තිබීම/රාජකාරි ආවරණය කර තිබීම.<br>*හා*<br>ත්‍රෛමාසික ඖෂධ සංයෝජක පුහුණු සහතික පත්‍ර පාඨමාලාව හදාරා සහතික ලබා තිබිය යුතු ය.<br><br>*බාහිර අයදුම්කරුවන්.-*<br>ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/ වානිජ්‍ය/අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 3 ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. නැතහොත් ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 3 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා සිටියු යුතු ය.<br>*හා*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසර 02 කට නොඅඩු කාලයක් සේවා පළපුරුද්ද ලබා තිබීම. |

*බඳවා ගැනීමේ ක්‍රමය.-* පලමුව සුදුසුකම් ලබන අභ්‍යන්තර සේවකයින් අතුරින් අයදුම්පත් කැඳවා පවත්නා පුරප්පාඩු පුරවන අතර එසේ සුදුසුකම් ලබන්නන් නොමැති නම් පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**වත්තල-මාබෝල නගර සභාව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම් - 2013*

........................................................................................ තනතුර

1. මුලකුරු සමග නම :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
3. ස්ථිර ලිපිනය :————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :————.
8. දුරකථන අංකය :————.
9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
10. විවාහක අවිවාහක භාවය :————.
11. අධ්‍යාපන සුදුසුකම් :

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

සමත් වර්ෂය හා විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |

12. වෙනත් සුදුසුකම් :————.
13. වෘත්තීය සුදුසුකම් :————.
14. සේවා පළපුරුද්ද :————.

14.1 දැනට සේවය කරන ආයතනය :————.
14.2 දැනට දරන තනතුර :————.
14.3 එම තනතුරට පත් වූ දිනය :————.
14.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන............. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. යන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ/
බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

අත්සන :————.
නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
දිනය :————.

03-968

## නිවැරදි කිරීමයි

### වත්තල ප්‍රාදේශීය සභාව

2013.03.01 වැනි දින පළකරන ලද අංක 1,800 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස තනතුරු-ඇබෑර්තු යටතේ ඉහත සඳහන් ප්‍රාදේශීය සභාවට අයත් නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2013.03.25 දක්වා දීර්ඝ කරනු ලැබේ.

කේ. එච්. එස්. අයිරාංගනී,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 05 වැනි දින,
වත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-841

---

### තංගල්ල නගර සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

තංගල්ල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් තංගල්ල නගර සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**උපලේඛනය**

| *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. නගර ශාලා භාරකරු | 01 | 11,730- 10 x 120 x 10 x 130- 10 x 145- 12 x 160 - 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සිංහල/දෙමළ භාෂාව, ගණිතය සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :*

01. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාවය මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිතව විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ සිය තනතුර ඇතහැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතු ය.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.

03. යම් අපරාධ නීති කෘත්‍යයකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයක දී ළඟු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.

04. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතු ය.

05. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

06. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

07. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුයි.

09. මෙම බඳවාගැනීම, අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී හෝ ඊට පසුව හෝ අතරමගදී හෝ අතහැර දැමීමට තංගල්ල නගර සභාවට බලය ඇත.

*විශේෂ සුදුසුකම් :*

01. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

02. ත්‍රීරෝද රථ හෝ බර වාහන රියදුරු බලපත්‍රයක් තිබීම, විදුලි කාර්මික හා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැණුමක් තිබීම, පෙදරේරු ශිල්පය හා වඩු ශිල්පය ගැන දැනුමක් හා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

03. අයදුම්පත් භාරගන්නා දිනට පෙර වසර 03 කට අධික කාලයක් නගර සභාවේ වැටුප් ලබමින් සේවය කර තිබීම. (ස්ථිර සේවයේ නොවන).

*මෙම විශේෂ සුදුසුකම් තිබෙන අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.*

*බඳවා ගැනීමේ ක්‍රමය.-* අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවාගැනීම කරනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

02. රජයේ ප්‍රතිපත්තිවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන රීති හා නියෝග වලට ද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ඒවාට අදාළ ව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, තංගල්ල නගර සභාව විසින් කරනු ලබන නියෝගවලට ද, අනුකූලව ක්‍රියාකිරීමට බැඳී සිටිය යුතුයි.

03. රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පණතට අනුව ඇප තැබිය යුතු ය.

04. රජයේ ප්‍රතිපත්තිවලට අදාළව නියම කරනු ලබන භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය.

05. බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව සාවද්‍ය තොරතුරුක් දක්වා ඇති බව තහවුරු වුවහොත් පත්වීම අහෝසි කරනු ලැබේ.

06. බඳවාගනු ලබන්නා ස්ථාන මාරුකිරීම්වලට යටත්වේ.

07. පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ. පරිවාස කාලය තුළ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොවේනම් සේවය අවසන් කරනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය.-* මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2013.04.12 වැනි දිනට පෙර ලැබෙන සේ "සභාපති තංගල්ල නගර සභාව" තංගල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එසේ නොමැති නම් තංගල්ල නගර සභාවේ ලේකම් වෙත අතින් භාරදී එය භාරදුන් බව සනාථ කරගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස කෙළවරේ................. (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතු ය.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය :

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
04. මෑතක දී ලබාගත් ග්‍රාම නිළධාරී සහතිකය,
05. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්,
06. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහිතක,
07. විශේෂ සුදුසුකම් පිළිබඳ සහතික.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**තංගල්ල නගර සභාව**

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2013*

*..........................................................තනතුර*

01. (අ) මුලකුරු සමග නම :—————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :—————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
04. ස්ථිර ලිපිනය :—————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
06. විවාහක/අවිවාහක බව :—————.
07. උපන් දිනය :—————. අවු. :————, මාස :————, දින :————.
2013.04.12 දිනට වයස ඃ අවු. :————, මාස :————, දින :————.
08. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද ?:—————.
10. අධ්‍යාපන සුදුසුකම් :—————.
11. වෙනත් සුදුසුකම් :—————.
12. වෘත්තීය සුදුසුකම් :—————.
13. විශේෂ සුදුසුකම් :—————.
14. සේවා පළපුරුද්ද :

(i.) දැනට සේවය කරන ආයතනය :—————.
(ii.) දැනට දරන තනතුර :—————.
(iii.) එම තනතුරට පත් වූ දිනය :—————.
(iv.) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුරු :—————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරුක් දක්වා ඇතොත් මා තෝරාගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.......................................................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරනු ලැබූ නිළධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
ආයතනය :—————.
දිනය :—————.

03-904

## තවලම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

තවලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත් සභාව තුළ ස්ථිර පදිංචි පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විස්තර පහත උපලේඛනයේ දැක්වේ.

### උපලේඛනය

| *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ප්‍රමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 1. මුරකරු | 01 | රු. 11,730 - 120 x 10 - 130 x 10 145 x10 - 160 x 12 - රු. 17,600 (රා. ප. ච. අංක 06/2006 (iv) PL1-2006 -A) | යටත් පිරිසෙයින් 08 වැනි ශ්‍රේණිය සමත් වීම |
| 2. මාර්ග කම්කරු | 03 | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 - රු. 17,600 (රා.ප.ච. අංක 06/2006 (iv) PL1-2006 -A) | යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත්වීම |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි.-*

(i.) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii.) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට/දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. (ආදේශක/අනියම්/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනමට පත්වීම අවුරුදු 18-45 ත් අතර සිදු විය යුතුය.)

(iii.) අයදුම්කරු දකුණු පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.

(ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)

(iv.) තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v.) විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍යය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(vi.) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.

(vii.) තවලම ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(viii.) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම තවලම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සතුය.

03. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි.-*

(i.) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් අරමුදල් යටතේ දායක මුදල් ගෙවිය යුතුය.

(ii.) පත්වීම් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(iii.) මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලට ද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද/දකුණු පළාත් සභාව හෝ තවලම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි වල මුල් පිටපත් සමග අමතර ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය ;

(i.) උප්පැන්න සහතිකය,
(ii.) අධ්‍යාපන සහතිකය,
(iii.) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(iv.) මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක්,
(v.) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්.

04. *අයදුම් කළයුතු ආකාරය.-*

මෙම නිවේදනයේ දැක්වෙන ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත සකස්කර 2013.03.31 දිනට පෙර "සභාපති, තවලම ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 04 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**තවලම ප්‍රාදේශීය සභාව**

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ...................................... තනතුර සඳහා බඳවා ගැනීම***

1. (i) මුලකුරු සමග නම :————.
   (ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3. ස්ථිර පදිංචි ලිපිනය :————.
4. (i) උපන් දිනය ඃ අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
   (ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස ඃ අවුරුදු :————, මාස :————, දින :————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද ? :————.
8. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය සඳහන් කරන්න) ————,
9. වෘත්තිය සුදුසුකම්/සේවා පළපුරුද්ද :————.
10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ***

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ................................................ තනතුර දරන...................................................... මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

03-974

## මිනුවන්ගොඩ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් බේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු II "ආ" | 02 | PL3/2006A | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | 1. අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය නවය වසර සමත් විය යුතුය.<br>2. තාරබර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ හෝ ඊට වැඩි බර පන්තියක වාහන පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම.<br>3. වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>4. දිවා රාත්‍රී සේවයේ යොදන බැවින් ශාරීරික වශයෙන් සුදුසු විය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>5. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුමක් තිබිය යුතුය. |
| 02 | වැඩ කම්කරු (වෙළඳසැල් කම්කරු) කා. සේ. සේ. III) | 02 | PL/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 x 145 x 10 - 160 x 12 - රු. 17,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතුය. |
| 03 | සෞඛ්‍ය කම්කරු (කා. සේ. සේ. III) | 04 | PL1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 x 145 10 -160 x 12 - රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 04 | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | PL2/2006A | රු. 12,210 - 10 x 130 x 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම, තනතුරුට අදාළව අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්දක් ලබා තිබීම සහ ගල් රෝල, බැකෝ යන්ත්‍ර ක්‍රියා කරවීම සම්බන්ධයෙන් රජයේ පිළිගත් ආයතනයක සහතිකය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම හා අදාළ තනතුරේ වසර 02 ක පළපුරුද්දක් ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 05 | පුස්තකාල සහායක (කා. සේ. සේ.II) | 02 | PL1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 -රු. 17,600 ආරම්භක වැටුප මෙම වැටුප් පරිමාණයේ 12 වැනි වැටුප් පියවර වන රු. 13,060 වේ. (හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් හයකින් සමත් වී තිබීම |
| 06 | කාර්යාල කාර්ය සහායක (කා. සේ. සේ. II) | 01 | PL1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10-160 x 12 - රු. 17,600 ආරම්භක වැටුප මෙම වැටුප් පරිමාණයේ 12 වැනි වැටුප් පියවර වන රු. 13,060 වේ. (හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් හයකින් සමත් වී තිබීම |
| 07 | කාර්යාල කම්කරු | 01 | PL1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10- 145 x 10 -160 x 12- රු. 17,600 (හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) 5 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. |
| 08 | ආදාහනාගාර සහායක | 01 | PL1/2006A | රු. 11,730 - 120 x 10 -130 x 10 - 145x10 -160 x 12, රු. 17,600 (හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) 5 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. |
| 09 | වෙළඳසල් පරිපාලක | 01 | MN2/2006A | | දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය/සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත් වී තිබීම හා මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර සිංහල හා දෙමළ භාෂාවලින් කථා කිරීමේ හැකියාව තිබිය යුතු ය.<br><br>මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වන අතර එම පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 ක ප්‍රශ්න පත්‍රයකින් යුක්ත වේ. |

2. *පොදු සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
4. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

3. *බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය.
2. නියම කරනු ලබන ප්‍රතිශතයකින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි.-* පත්වීම් ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාතේ පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

5. *අයදුම්පත් ඉදිරිපත් කිරීම.-* ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස්කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2013.04.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, නගර සභාව, මිනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තව ද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතු ය :-

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. ග්‍රාම නිලධාරි සහතිකය,
4. පළපුරුද්ද පිළිබඳ සහතිකය,
5. චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේ දී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියලු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතු වේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම්,
නගර සභාව, මිනුවන්ගොඩ.

2013 මාර්තු මස 07 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ................................ තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

1. (i) මුලකුරු සමග නම :————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3. ස්ථිර ලිපිනය :————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. උපන් දිනය : අවුරුද්ද :——— මාසය:——— දිනය :———.
7. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :————.

8. විවාහක/අවිවාහක බව :————.

9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචිවීමෙන් ද ? :————.

10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

11. රියැදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියැදුරු තනතුර සඳහා අදාළ වේ.) :————.

12. (i) වෙනත් සුදුසුකම් :————.
(ii) වෘත්තීය සුදුසුකම් :————.
(iii) සේවා පළපුරුද්ද :————.

13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ඃ ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :————.

එම තනතුරට පත් වූ දිනය :————.

14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පුවුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-902

---

## ජා-ඇල ප්‍රාදේශීය සභාව - කඳාන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජාඇල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *නියමිත තනතුරු සඳහා පොදු සුදුසුකම් ඃ-*

(i) අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතුයි.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත).

(iii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ, පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුයි.

02. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම ៖-*

(i) සේවා අවශ්‍යතාවයට අනුව විභාග ප්‍රතිඵල මත/විධිමත් සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

(ii) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2013.04.16 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ජාඇල ප්‍රාදේශීය සභාව, කඳාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය).

(iii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුයි.

(iv) අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතු ය ៖-

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතික,
*(ඇ)* ජාතික හැඳුනුම්පත් පිටපත,
*(ඈ)* පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් සහතික කර ගත් ග්‍රාම සේවක සහතිකය,
*(ඉ)* මෑතක දී ලබාගත් චරිත සහතික 2 ක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබාගත් එකක් විය යුතුයි.),
*(ඊ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-* මෙම තනතුර ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය.

04. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතුරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ජාඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

05. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී ලිඛිත විභාග/ප්‍රායෝගික පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
(දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත්, සිංහල අර්ථය ප්‍රමුඛ කොට සැලකිය යුතු ය.)

එල්. ඒ. එම්. සමන්ති,
ලේකම්,
ජාඇල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 07 වැනි දින,
ජාඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත පරිපාලක II ශ්‍රේණිය | 02 | MN1-2006-A<br>රු. 13,120 - 10 x 145 - 11 x 170-10 x 240 - 10 x 320 - රු. 22,040 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. සා පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය, වාණිජ්‍ය අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>*හෝ*<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>*හෝ*<br>පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පංතිය සාමාර්ථයක් ලබා තිබීම.<br>මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මතය ៖-<br>* සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය පැය 1 1/2<br>* සාමාන්‍ය දැනුම පරීක්ෂණය පැය 01<br>ආදී වශයෙන් වන ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වේ. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | රියදුරු II "ආ" | 09 | PL3-2006A<br>රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 -රු.18,860<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලක අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/09 වසර සමත් වී සිටිය යුතු ය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>පුද්ගලික/කුලී රථ සඳහා තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br><br>*වෙනත් සුදුසුකම් :*<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතු ය. දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය. |
| 03 | විදුලි කම්බිකරු (ශිල්පීය II ශ්‍රේණිය) | 01 | PL3-2006A<br>රු. 12,470 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 -රු. 18,860<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක වරක දී සමත් වී තිබිය යුතු ය.<br><br>*සහ*<br><br>විදුලි රැහැන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම හා අලුත්වැඩියා කිරීම, විදුලි උපකරණ හෝ විදුලි උපාංගවල නඩත්තුව, සියලු විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව යන කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 2 ක පළපුරුද්ද ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :-*<br><br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 මට්ටමේ සහතිකය ලබා තිබීම :<br><br>*හෝ*<br><br>කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම : |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *හෝ*<br><br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම ;<br><br>*හෝ*<br><br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>මේ සඳහා බඳවා ගනු ලබන්නේ පහත පරිදි වූ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත ය.<br><br>*ලිඛිත පරීක්ෂණය :-*<br><br>තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි පිළිබඳව න්‍යායාත්මක දැනුම් පරීක්ෂා කරනු ලැබේ. ප්‍රශ්න 40 කින් යුත් බහුවරණ ප්‍රශ්නපත්‍රයක් වන අතර, කාලය පැය 01 කි. උපරිම ලකුණු 100 (අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු ය.)<br><br>*ප්‍රායෝගික පරීක්ෂණය :-*<br><br>තනතුරට අදාළව පැවරී ඇති රාජකාරී ඉටු කිරීමේ හැකියාව පිළිබඳව ප්‍රායෝගිකව පරීක්ෂා කරනු ලැබේ.<br><br>මෙහි දී, විදුලි රැහැන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම හා අලුත්වැඩියා කිරීම, විදුලි උපකරණ හෝ විදුලි උපාංගවල නඩත්තුව, සියලු විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව යන කටයුතු ආදී කාර්යයන් පිළිබඳව පරීක්ෂණ මණ්ඩලය විසින් වාචිකව ද ප්‍රශ්න විමසනු ලැබේ. (කාලය පැය 1/2 ; ලකුණු 100) |

| අනු අංකය | | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 04 | | පුස්තකාල සහායක (කාර්යාල සේවක සේවයේ II) | 02 | PL1-2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතු ය. |
| 05 | | කාර්යාල කාර්ය සහායක - | | | |
| | (i) | පණිවුඩකරු (කාර්යාල සේවක සේවයේ II ශ්‍රේණිය) | 01 | PL1-2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතු ය. |
| | (ii) | කාර්යාල කාර්ය සහායක (කාර්යාල සේවක සේවයේ II ශ්‍රේණිය) | 03 | PL1-2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතු ය. |
| | (iii) | කාර්යාල කම්කරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 01 | PL1- 2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/09 වසර සමත් විය යුතු ය. |
| 06 | | වැඩ කම්කරු - | | | |
| | (i) | ආයුර්වේද කම්කරු (කා.සේ. සේ.III) | 01 | PL1- 2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/09 වසර සමත් විය යුතු ය. |
| | (ii) | පුස්තකාල කම්කරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 05 | PL1- 2006 -A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/09 වසර සමත් විය යුතු ය. |
| | (iii) | විදුලි කම්කරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 02 | PL1- 2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/09 වසර සමත් විය යුතු ය. |
| | (iv) | මාර්ග කම්කරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 05 | PL1- 2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අවම වශයෙන් 05 ශ්‍රේණිය/06 වසර සමත් විය යුතු ය. |
| 07 | | සෞඛ්‍ය කම්කරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 05 | PL1- 2006-A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | අධ්‍යාපන සුදුසුකම් බල නොපායි. |

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජා-ඇල ප්‍රාදේශීය සභාව***

*.............................................................තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
03. ස්ථිර ලිපිනය :—————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
06. උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.
08. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :—————.
09. විවාහක ද/අවිවාහක ද යන බව :—————.
10. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
11. අධ්‍යාපන සුදුසුකම් :—————.
(සහතිකවල පිටපත් අමුණා ඇත)
12. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :—————.
(සහතිකවල පිටපත් අමුණා ඇත)
13. සේවා පළපුරුද්ද :—————.
14. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වැරදිකරු වී ඇත්නම් එම වරදට ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :——————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන........................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ............................................ කු වශයෙන් සේවය නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත්,ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකුල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.

පදවි නාමය :—————.

දෙපාර්තමේන්තුව/ආයතනය :—————.

(නිල මුද්‍රාව යොදන්න)

දිනය :—————.

03-977

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සභා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01.1 රියදුරු - III වැනි පන්තිය (ප්‍රාථමික ශිල්පීය)

01.2 සෞඛ්‍ය කම්කරු - III වැනි පන්තිය (ප්‍රාථමික - ශිල්පීය නොවන)

01.3 වැඩ/ක්ෂේත්‍ර කම්කරු - III වැනි පන්තිය (ප්‍රාථමික - ශිල්පීය නොවන)

01.4 මුරකරු - III වැනි පන්තිය (ප්‍රාථමික - ශිල්පීය නොවන)

01.5 පුස්තකාල සහායක - III වැනි පන්තිය (ප්‍රාථමික - ශිල්පීය නොවන)

02. *වැටුප් පරිමාණය.-*

02.1 වැඩ/ක්ෂේත්‍ර කම්කරු මුරකරු හා පුස්තකාල සහායක තනතුරුවලට අයත් වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) හි PL1 -2006-A අනුව
රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600
(මෙම වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

02.2 *රියදුරු තනතුර සඳහා වැටුප් පරිමාණය.-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) හි PL3 -2006 - A අනුව
රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860
(මෙම වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

03. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි.-*

03.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

03.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

පුරප්පාඩු සංඛ්‍යාවට පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටෙකදී පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයන්හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත.

03.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

03.4 සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතු ය.

03.5 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛණයට නම ඇතුලත් නොවිය යුතු ය.

04 *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි.-*

04.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය.

04.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

04.3 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. පරිවාස කාලය අවසානයේ දී වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක තැනැත්තන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා සලකා බලනු ලැබේ.

04.4 2007.05.28 දිනැති 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුලත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය. මේ සඳහා සභාවේ ලේකම්වරයා විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකින් සමත්විය යුතු ය.

04.5 මෙහි සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසි, සේවා ව්‍යවස්ථා හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වලට අමතරව රජය පළාත් සභාව, සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කෙරෙන නියෝගද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද මෙම පත්වීම යටත් ය.

04.6 ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ.

05. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

05.1 සෞඛ්‍ය කම්කරු - III වැනි පන්තිය සඳහා

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද පාසලක 8 ශ්‍රේණිය (9 වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබීම.

05.2 මුරකරු වැඩ/ක්ෂේත්‍ර කම්කරු, පුස්තකාල සහායක - III වැනි පන්තිය සඳහා

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

05.3 රියදුරු - III වැනි පන්තිය සඳහා

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)

*සහ*

අවම වශයෙන් බර වාහන රියදුරු - ඞී ශ්‍රේණියේ (පැරණි රියදුරු බලපත්‍රය අනුව ඒ ශ්‍රේණියේ) රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය. ට්‍රැක්ටර් රියදුරු තනතුරු සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් ජී 1 ශ්‍රේණියේ රියදුරු බලපත්‍රය ලබාගෙන තිබිය යුතුය. (ත්‍රී රෝද රථ බලපත්‍රය ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ - බී 1)

*සහ*

උස අඩි 05 යි අඟල් 2.5 වැඩි වීම

*සහ*

රියදුරු බලපත්‍රය අවම වශයෙන් වසර 03 ක් වත් පැරණි විය යුතු අතර රියදුරු වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද ලිඛිතව සනාථ කළ යුතු ය.

සටහන.- සියලුම අයදුම්කරුවන්හට මහා මාර්ග නීති පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. (අවශ්‍ය වන්නේ නම් ඒ බව ලිඛිත සාක්ෂි මගින් සනාථ කිරීමට සිදු වනු ඇත)

06. *කාර්යක්ෂමතා කඩඉම්.*- බඳවා ගැනීමේ පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. (මුල් පත්වීමේ දිනයේ සිට වසර 03 ක් ඇතුලත)

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*-

07.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ.)

සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ;

(ii) අදාල අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත/විදුහලේ අස්වීමේ සහතිකය ;

(iii) මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ;

(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් ;

(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;

(රියදුරු තනතුර සඳහා අයදුම් කර ඇති අය රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. )

(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (රියදුරු තනතුර සඳහා අයදුම් කර ඇති අය එම ක්ෂේත්‍රයේ වසර 03 ක සේවා පලපුරුද්ද පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ).

07.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් රියදුරු තනතුර හැර අනෙකුත් තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

07.3 රියදුරු තනතුරු සඳහා අයදුම් කර තිබූ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා ලද අයදුම්රුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පිළිවෙලින් බඳවා ගනු ලැබේ.

07.4 මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් කෙරෙහි බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවය යොමු කරනු ලැබේ.

08. *අයදුම් කළ යුතු ආකාරය.-*

08.1 එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.

08.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොලයක දෙපැත්තම භාවිත කර සකස් කරන ලද අයදුම්පතක් 2013.04.05 දින හෝ ඊට පෙර "ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය)

08.3 අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය.

08.4 අසම්පූර්ණව හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

09. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ලේකම්වරයා සතු ය.

එච්. ඩී. මහින්ද,  
ලේකම්,  
මහනුවර කඩවත් සතර සහ,  
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,  
අම්පිටිය.

2013 මාර්තු මස 01 වැනි දින,  
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

කාර්යාලීය ප්‍රායෝජනය සඳහා

අංකය : ____________

ආදර්ශ අයදුම්පත්‍රය

**.................................................................................................. තනතුර සඳහා අයදුම් කිරීම**

***මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව***

01. 1.1 මුලකුරු සමග නම :—————.  
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

02. 2.1 ස්ථිර ලිපිනය :—————.  
2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :—————.

03. 3.1 උපන් දිනය :—————.  
3.2 2013.04.05 දිනට වයස ඃ අවු. :————, මාස :————, දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
06. අධ්‍යාපන සුදුසුකම් :

06.1 අධ්‍යාපනය ලද පාසල :————.
06.2 ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————.
06.3 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය :————.

වසර :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.4 අ.පො.ස. (උසස් පෙළ) විභාගය.-

වසර :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. *වෙනත් සුදුසුකම්.-*..........................................................................................

..........................................................................................

08. *සේවා පළපුරුද්ද.-*..........................................................................................

..........................................................................................

*අයදුම්කරුගේ ප්‍රකාශය*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන අය.................................................. මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය :

මෙම ඉල්ලුම්කරු වන.................................................................................. මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................. වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

03-967

---

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු III | 02 | (පීඑල් 3 - 2006 ඒ 6/2006 (IV) රා. ප. ච. ලේ. අනුව) රු. 12,470 - 10 x 130 10 x 145- 10 x 160 - 12 x 170 - රු. 18,860 (හතර වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ්‍ය ලබා තිබිය යුතු ය. ලොරි/ට්‍රැක්ටර්/ගිලන්රථ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාල සහතික ලබා තිබිය යුතු ය.)<br><br>වාහන රියැදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 02 | කාර්යාල කාර්ය සහායක | 02 | (පීඑල් 1- 2006 ඒ 6/2006 (IV) රා. ප. ච. ලේ. අනුව) රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145-12 x 160 රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි |
| 03 | සෞඛ්‍ය කම්කරු | 02 | (පීඑල් 1- 2006 ඒ 6/2006 (IV) රා. ප. ච. ලේ. අනුව) රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145-12 x 160. රු. 17,600 (හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම |
| 04 | ක්ෂෙත්‍ර කම්කරු (මාර්ග කම්කරු) | 04 | (පීඑල් 1- 2006 ඒ 6/2006 (IV) රා. ප. ච. ලේ. අනුව) රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145-12 x 160 රු. 17,600 (හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 05 | පුස්තකාල සේවිකා | 03 | (පීඑල් 1 - 2006 ඒ 6/2006 (IV) රා.ප.ච. ලේ අනුව) රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160- රු. 17,600 (හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 06 | ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු (අර්ධ ශිල්පීය III ශ්‍රේණිය) | 01 | (පීඑල් 2 - 2006 ඒ 6/2006 (IV) රා.ප.ච. ලේ. අනුව) රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 07 | ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු සහායක (ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | (පීඑල් 1 - 2006 ඒ 6/2006 (IV) රා.ප.ච. ලේ. අනුව) රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 -රු. 17,600 (හතර වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |

*අවශ්‍ය වෙනත් සුදුසුකම්.-*

1. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
2. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
5. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූ හෝ රා.ප.පා.ච. ලේ. 44/90 යටතේ විශ්‍රාම ලැබූ අයෙකු නොවිය යුතු ය.
6. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන සේවක/සේවිකාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

*සේවා කොන්දේසි.-*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහතිකය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. තෝරාගනු ලබන සේවක/සේවිකාවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
5. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සළකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය.-* මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස්කර 2013.04.05 දිනට පෙර "ලේකම්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, බරිගම, වැරැල්ලගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ :-

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාමසේවා සහතිකය,
4. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
5. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය,
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
7. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් අදාල තනතුර සඳහා බඳවා ගනු ලැබේ.
2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතුරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

බරිගම, වැරැල්ලගම,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

..................................................... ***තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
02. තැපැල් ලිපිනය :————.
03. උපන් දිනය : අවුරුද්ද :———— මාසය :———— දිනය :————.
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු. :———— මාස :———— දින :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
06. විවාහක/අවිවාහක බව :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද/එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

09. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :————.

වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් (සහිතක/බලපත්‍ර) :————.
12. සේවා පළපුරුද්ද :————.
13. වෙනත් සුදුසුකම් :————.
14. කිසියම් වරදකට හෝ කෙදිනක හෝ උසාවියක දී වරුදිකරු වී ඇත්නම් ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න. :——.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවරුදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට සිදුවන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-782

## පළාත් පාලන නිවේදන

### මහරගම නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරයේ 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාල දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

| පාරේ නම | විස්තරය | දිග අඩි | පළල | ආරම්භය | අවසානය |
|---|---|---|---|---|---|
| ගංගොඩවිල, මීගහවත්ත පාර, අංක 35/16, 35/12, 35/24A , 35/24B, 35/1, 35/22, 35/22A , 35/17 දරන නිවාස පිහිටි අතුරු මාර්ගය | එස්. වික්‍රමසිංහ මිනින්දෝරු තැන විසින් 2013.01.01 වැනි දින මැන සකස් කරන ලද අංක 6761 දරන මිනින්දෝරු සැලැස්මට අනුව | 200 | අඩි 10 | 35/10 | 35/16 |
| කොට්ටාව, කුලසෙවණ පාර අංක 698/6/A, 698/1/A, 698/A 698/6, 698/1 දරන නිවාස පිහිටි අතුරු මාර්ගය | මර්වින් සමරනායක මිනින්දෝරු තැන විසින් 2001.10.04 වැනි දින නැවත මැන සකස් කරන ලද අංක 2696 දරන මිනින්දොරු සැලැස්මට අනුව | මීටර් 90 | මීටර්. 3.0 | 923 | 926 |

03-852

---

**යාපනය මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර ලබාදීමේ පනත

පහත නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2013 වර්ෂයට ලබා ගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර දීමේ පනතේ 6 වැනි වගන්තියේ (ඈ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය හෝ අදාල හෝ යාඥාව යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට සති හරතක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

ඇස්. ප්‍රණවනාදන්,
මහ නගර කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
මහ නගර සභාව,
යාපනය.

| අංකය | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | සමාජ ශාලාවේ සභාපති ද, ලේකම් ද, කළමනාකරු ද, යන වග | සමාජ ශාලාවේ නම | සමාජශාලාවේ කටයුතු කරගෙන යෑමට බලාපොරොත්තු වන ස්ථානය |
|---|---|---|---|---|
| 01 | ඒ. ඒ. ජාන්ස්ටන් අංක 68, රාසාවන් තෝට්ටම් වීදිය, යාපනය | ලේකම් | සෙවන් ලෙවන් ක්‍රීඩා සමාජය | අංක 66, රාසාවන් තෝට්ටම් වීදිය යාපනය |

03-908

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

**සම්මත අතුරු ව්‍යවස්ථාව**

261 වැනි අධිකාරිය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2012.11.06 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 07 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. ඩී. වසන්ත කුමාර,
සභාපති,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 05 වැනි දින,
යටියන්තොට සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2011.01.28 දිනැති අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (*ගැසට් පත්‍රයේ*) iv (ආ) වන කොටසේ පළ කරන ලද සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරන ලද්දාවූ සබරගමුව පළාතේ යටියන්තොට බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව/ගැසට් පත්‍රයේ පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ යටියන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

03-903

---

**පානදුර නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

**වලාන පාර "අධිනීතිඥ ලෙනින් ප්‍රනාන්දු මාවත" නමින් නම් කිරීම**

2012.07.25 වැනි දින පානදුර නගර සභාවේ පැවති මහ සභා රැස්වීමේ දී තීරණ අංක 6.2 දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. (255 වැනි අධිකාරිය වන) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 55(අ) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධි විධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද 2013.01.31 දිනැති අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "අධිනීතිඥ ලෙනින් ප්‍රනාන්දු මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. නන්දන ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව,
පානදුර.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
පානදුර,
පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | පානදුර නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | කළුතර |
| 3. | වීථියේ වර්තමාන නම | : | වලාන පාර |
| 4. | අළුතින් යොදා ඇති නම | : | "අධිනීතිඥ ලෙනින් ප්‍රනාන්දු මාවත" |
| 5. | මාර්ග විස්තර | : | වලාන ග්‍රාමයේ වරිපනම් අංක 89 බෙක්කේ ගම පාරෙන් ආරම්භ වී අංක 37 ඒ මහානාම පාරෙන් අවසන් වන මීටර් 720 ක් දිගින් යුතු මීටර් 9 ක් පළල දැනට වලාන පාර නමින් හැඳින්වෙන මාර්ගය |

03-865/1

**පානදුර නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

**කුඩා පොකුණ පාර "කේ. ඩී. ජේම්ස් මාවත" නමින් නම් කිරීම**

2011.05.31 වැනි දින පානදුර නගර සභාවේ පැවති මහ සභා රැස්වීමේ දී තීරණ අංක 7:3:6 දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. (255 වැනි අධිකාරිය වන) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 55(අ) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධි විධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද 2012.11.08 දිනැති අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "කේ. ඩී. ජේම්ස් මාවත" නමින් නම් කිරීම යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. නන්දන ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව,
පානදුර.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 1. | පලාත් පාලන ආයතනයේ නම | : | පානදුර නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | කළුතර |
| 3. | වීථියේ වර්තමාන නම | : | කුඩා පොකුණ පාර |
| 4. | අළුතින් යොදා ඇති නම | : | "කේ. ඩී. ජේම්ස් මාවත" |
| 5. | මාර්ග විස්තරය | : | තන්තිරිමුල්ල ග්‍රාමයේ හිරණ පාරෙන් ආරම්භ වී වරිපනම් අංක 134/4 න් අවසන් වන දික් අඩි 395 ක ප්‍රමාණයක් දිගින් යුත් අඩි 14 ක් පළලින් යුතු දැනට කුඩා පොකුණ පාර නමින් හැඳින්වෙන මාර්ගය |

03-865/2

---

**මහව ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමේ නිවේදනය සංශෝධනය කිරීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2012.11.30 දිනැති සහ අංක 1787 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් සභා ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ 2221 පිටුවේ පළ කරන ලද 2013 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම සඳහා වූ නිවේදනයේ දෙවන ඡේදයේ පළමු පෙලේ සඳහන් "අප්‍රේල් මස 30" යන්න "මාර්තු මස 31" ලෙස සංශෝධනය විය යුතු බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. ආර්. ආර්. ඩබ්. කේ. මැදගෙදර,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-781/1

## මහව ප්‍රාදේශීය සභාව

### යම්කිසි කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාලව අතුරු ව්‍යවස්ථාව යටතේ 2013 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම සඳහා වූ නිවේදනය සංශෝධනය කිරීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2012.11.30 දිනැති සහ අංක 1787 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් සභා *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2222 පිටුවේ පළ කරන ලද යම්කිසි කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ 2013 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම සඳහා වූ නිවේදනයේ දෙවන ඡේදයේ පළමු පෙළේ සඳහන් "2012" යන්න "2013" ලෙස සංශෝධනය විය යුතු බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. ආර්. ආර්. ඩබ්. කේ. මැදගෙදර,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-781/2

---

## මහව ප්‍රාදේශීය සභාව

### 2013 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම සඳහා වූ නිවේදනය සංශෝධනය කිරීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2013.11.30 දිනැති සහ අංක 1787 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් සභා *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2226 පිටුවේ පළ කරන ලද 2013 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම සඳහා වූ නිවේදනයේ දෙවන ඡේදයේ පළමු පෙළේ සඳහන් "අප්‍රේල් මස 30" යන්න "මාර්තු මස 31" ලෙස සංශෝධනය විය යුතු බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. ආර්. ආර්. ඩබ්. කේ. මැදගෙදර,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-781/3

---

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24, 24 (1) 24 (2) හා 24 (3) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) වැනි පළාත් පාලන කොටසේ අංක : 1694 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම අනුව කිසියම් පාර්ශවයක් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කර නොලැබ ඇති හෙයින්, යථෝක්ත *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ මාර්ග, මංමාවත් හා පටු මාවත් ප්‍රාදේශීය සභාව සතු පොදු මාර්ග, මංමාවත් හා පටු මාවත් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දේශබන්ධු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 01 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය,
බෝයගනේ.

03-822/1

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයක් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේශබන්ධු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 01 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය,
බෝයගනේ.

*උපලේඛනය*

| | *පාරේ නම* | *දිග* | *පලල* | *වම්පස ඉඩම් හිමියන්* | *දකුණු පස ඉඩම් හිමියන්* |
|---|---|---|---|---|---|
| 01 | මලගනේ පහලගෙදර ගම මැදින් වෙල දක්වා යන මාර්ගය | අඩි : 2014 | අඩි 12 | 1. ජයලත්ගේ ගාමිණී විජේතිලක<br>2. ජයලත්ගේ සුනිල් රංජිත්<br>3. ජයලත්ගේ ශාන්ත කුමාර<br>4. රත්නායක මුදියන්සේලාගේ ජයසේන | 1. රංකොත්ගේ අබේදාස<br>2. රංකොත්ගේ ප්‍රේමරත්න<br>3. රංකොත්ගේ මහින්ද සරත්චන්ද්‍ර<br>4. රංකොත්ගේ විමලරත්න<br>5. රංකොත්ගේ උපාලි ජෝෂප් කුමාරසිංහ<br>6. රංකොත්ගේ විජේසිරි<br>7. රංකොත්ගේ ප්‍රැන්සිස් ජෝෂප් |

03-822/2

---

**බදුල්ල මහ නගර සභාව**

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.01.30 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදන ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30 ක් තුළදී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංකය | වම් පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | කණුපැලැල්ල උක්වත්ත නිවාස භූමිය ඇතුලත මාර්ගය | කණුපැලැල්ල ශ්‍රී සර්විස් ආයතනය අසලින් | 312 | 310/2A, 310/4 310/3, 310/5/312 | 308, 306 | 83m | 3.0 m |

03-975

---

**ගම්පහ මහා නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලා පනත 1987 අංක 38 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත

පහත නම් සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2013 වර්ෂයට බලපත්‍ර ලබාගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බැව් 1975 අංක 17 දරන සමාජශාලා පනත සහ 1987 අංක 38 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනතේ 6 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල පදිංචි යම් අයෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වන දින සිට සති හතරක් ඇතුලත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දක්වමි.

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | සමාජශාලාවේ ලේකම් ද කළමනාකරු ද සභාපති ද යන වග | සමාජශාලාවේ නම | සමාජශාලාවේ කටයුතු කරගෙන යෑමට බලාපොරොත්තු වන ස්ථානය |
|---|---|---|---|
| ජේ. විමල්ගේ මයා ශාන්ති පාර ගම්පහ. | ලේකම් | ගම්පහ ක්‍රීඩා සමාජශාලාව | 15/2/1, මංගල පාර |

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහා නගර සභාව.

03-969

---

**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව**

බුලත්කොහුපිටිය පන්නල කලාපය දියුණුගම් ප්‍රදේශයක් බවට පත්කිරීම

2011 මැයි මස 26 වැනි දින පැවති බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ තීරණ අංක 05 යටතේ නව ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස නාගරික කලාපයක් බවට සංවර්ධනය කර දියුණුගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පන්නල කලාපය සුදුසු බවට යෝජනා සම්මත කර ඇති අතර ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය මගින් පවරා ඇති බලතල ප්‍රකාර බුලත්කොහුපිටිය සතිපොළ ආසන්නයේ අංක 26/5 දරන බෝක්කුව අසල සිට බුලත්කොහුපිටිය - රුවන්වැල්ල පාරේ වෑගඩ අංක 34/5 දරන බෝක්කුව දක්වා වූ කලාපය දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සබරගමුව පළාත් පාලන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව කෑගල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් අනුමැතිය ලබා දී ඇති බැවින් උක්ත කලාපය (පන්නල කලාපය) නව වරිපනම් බදු අයකරනු ලබන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කර ඇති අතර අය කරනු ලබන වරිපනම් ප්‍රතිශතය 5% ක් බවත් බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ප්‍රකාශයට පත් කරමි.

එම කලාපයේ සිතියම පහත දැක්වේ.

ඩී. බී. රුවන් සංජීව දියසුන්නත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
බුලත්කොහුපිටිය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව.




Sri Lanka Institute of Local Governance

03-851

# විවිධ දැන්වීම්

## චාවකච්චේරි නගර සභාව

### 2013 වසර සඳහා ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු හා බදු අයකිරීම්

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162, 165 වැනි වගන්ති වලින් ලබා දී ඇති බලතල ප්‍රකාරව 164 වැනි වගන්තියට අනුව චාවකච්චේරි නගර බල සීමාව ඇතුළත් ප්‍රදේශ වලින් I වැනි පේලියෙන් දක්වා ඇති කිසියම් අත්කර්මාන්තයක් නැතහොත් ව්‍යාපාරක්, 2013 වැනි වසරේ පවත්වාගෙන යාමට නිකුත් කර ඇති බලපත්‍රයට අනුකූලව තක්සේරුකිරීම් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ප්‍රතිසංස්ශෝධන තක්සේරු කිරීමට අනුව එම අත්කර්මාන්තය නැතහොත් ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම II වැනි පේලියෙන් දක්වා ඇති සීමාවට ඇතුළත් වැනි අවස්ථාවන්හි දී, පහත පෙන්නුම් කර ඇති වටිනාකම් පදනමින් බලපත්‍ර ගාස්තු හා බදු අයකරන බවට 2013.01.11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී රැස්වීම් තීරණ අංක 1, 2 යටතේ තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

මෙම බලපත්‍ර ගාස්තු හා බදු 2013.03.13 වැනි දිනට ප්‍රථමයෙන් ගෙවීම් කළ යුතු බවටත් මෙයින් දන්වා සිටිමි.

කලින් තක්සේරු නොකරන ලද ව්‍යාපාර ස්ථානයක් සම්බන්ධයෙන් නගර සභාවේ රැස්වීම් තීරණය මගින් කටයුතු කරනු ඇත. තාවකාලික තක්සේරු කිරීමකට අනුව බලපත්‍ර ගාස්තු ගෙවීම් කළ යුතුවේ.

එක සමාන බදු තක්සේරු අංකයක් යටතේ අත්කර්මාන්ත (වෙළඳාම් එකකට වැඩි සංඛ්‍යාවකින්) කරනු ලබන්නේ නම් එවැනි එක් එක් අත්කර්මාන්තයකටම (එක් වෙළඳාමක්) අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා ඉඩම් ප්‍රමාණය, තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම පදනම් කරගත් ගාස්තු නැතහොත් බදු ප්‍රතිශතය තීරණය කිරීමත් සමග එම බදු ප්‍රතිශතය ගාස්තු ලෙස ගෙවීම් කළ යුතුවේ.

ඉරප්පියෙල් දේවසගායම්පිල්ලෙයි,
සභාපති,
නගර සභාව, චාවකච්චේරිය.

2013 මාර්තු මස 04 වැනි දින,
නගර සභා කාර්යාලය,
චාවකච්චේරිය.

**ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු හා බදු - 2013**

| *I වැනි පේලි* | | *II වැනි පේලි* | | | |
|---|---|---|---|---|---|
| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික බද්ද* | | | |
| | | *රු. 1,500 නොඉක්මවන* | *රු. 1,501 ත් රු. 3,500 ත් අතර* | *රු. 3,501 ත් රු. 4,500 ත් අතර* | *රු. 4,501 ඉක්මවන* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| (A) *අන්තරාදායක වෘත්තීන් :* | | | | | |
| 01. | හෝටලයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 02. | නවාතැන් පවත්වාගෙන යාම (කෑම පහසුකම් සහිතව) | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 03. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 04. | තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 05. | තේ පැන් ශාලාවක් සහ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 06. | සිසිල් පැන් අලෙවි සැලක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 07. | සිසිල් පැන් නිෂ්පාදනය සහ අලෙවිය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 08. | පාන් පෝරණුවක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 09. | මෝටර් රථ අළුත් වැඩියාකිරීමේ ස්ථාන | | | | |
| | (අ) ලේත් යන්ත්‍ර වැඩ, ස්ප්‍රේ පෙයිටිං ටිංකරිං වැඩ | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| | (ආ) විදුලි/ගෑස් වෙල්ඩිං සමග මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| | (ඇ) ලේත් වැඩ පමණි | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| | (ඈ) මෝටර් රථ අළුත්වැඩියා කිරීම් පමණි | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 10. | මෝටර් රථ සර්විස් කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 11. | ටයර්, ටියුබ් වල්කනයිස් කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |

| *I වැනි පේළි* | | *II වැනි පේළි* | | | |
|---|---|---|---|---|---|
| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික බද්ද* | | | |
| | | *රු. 1,500 නොඉක්මවන* | *රු. 1,501 ත් රු. 3,500 ත් අතර* | *රු. 3,501 ත් රු. 4,500 ත් අතර* | *රු. 4,501 ඉක්මවන* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 12. | මෝටර්, විදුලි රැහැන් නැවත සවිකිරීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 13. | පා පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 14. | දර අලෙවි ස්ථාන | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 15. | දැව කපන ස්ථාන පවත්වාගෙන යාම (යන්ත්‍රෝපකරණ) | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 16. | දැව කපන ස්ථාන පවත්වාගනෙ යාම (පිරිස් බල) | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 17. | කපාපු දැව අලෙවිය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 18. | වඩු වැඩ | | | | |
| | *(අ)* මෝටර් රථ බොඩි සෑදීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| | *(ආ)* ගෘහ භාණ්ඩ නිපදවීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| | *(ඇ)* සාමාන්‍ය වඩු වැඩ | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 19. | රන් ආභරණ වැඩපල | | | | |
| | *(අ)* එක් අයෙක් වැඩ කරන | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| | *(ආ)* එක් අයෙකුට වඩා වැඩි | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 20. | කොන්ඩා මෝස්තර කිරීමේ ස්ථාන | | | | |
| | *(අ)* එක් අයෙක් වැඩ කරන | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| | *(ආ)* එක් අයෙකුට වඩා වැඩි | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 21. | රෙදි සෝදන ස්ථාන (ලොන්ඩරිය) | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 22. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථාන | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 23. | යකඩ කම්හල් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 24. | විදුලි, ගෑස් වෙල්ඩිං වැඩපල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 25. | මස් අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 26. | රා තැබෑරුම් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 27. | මත්පැන් අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 28. | පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් වර්ග පිරවුම් හල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 29. | කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය අලෙවිය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 30. | රෙදිපිලි වලට සායම් දැමීම, මුද්‍රණ වැඩ | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 31. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 32. | මිරිස්, ධාන්‍ය ඇඹරුම්හල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 33. | සහල් මෝල සහ ඇඹරුම්හල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 34. | සිමෙන්ති ගබඩාකර අලෙවි කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 35. | උළු කැට, සීට්, ගඩොල්, ගැල්වනෛස් තහඩු රැස්කර, අලෙවි කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 36. | යන්ත්‍රෝපකරණ මගින් ගල් කැපීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 37. | ඡායාරූප ගැනීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 38. | පුද්ගලික සංනිවේදන ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 39. | ටිංකරින් වැඩකරන ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 40. | කුකුල් කොටුවක් පවත්වාගෙන යාම (කුකුලන් 50 ට වැඩි) | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 41. | වාහනයක් මගින් අයිස් ක්‍රීම් අලෙවි කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 42. | ගමනාගමන සේවා ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 43. | හුණු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 44. | වෛද්‍ය රසායානගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 45. | ගෑස් සිලින්ඩර අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 46. | කොහු හස්ත කර්මාන්ත | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 47. | කරවල රැස්කර අලෙවි කිරීම | 1,500 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 48. | පපඩම් සාදා අලෙවි කිරීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |

| I වැනි පේළි | | II වැනි පේළි | | | |
|---|---|---|---|---|---|
| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද | | | |
| | | රු. 1,500 නොඉක්මවන | රු. 1,501 ත් රු. 3,500 ත් අතර | රු. 3,501 ත් රු. 4,500 ත් අතර | රු. 4,501 ඉක්මවන |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 49. | පුද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 50. | කිරි වර්ග අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 51. | පාන්, බිස්කට්, පැණි රස කෑම අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 52. | ගෑස් පිරවූ බිම, පළතුරු යුෂ නිෂ්පාදනය කිරීමේ ස්ථාන | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 53. | විදුලි පංකා අළුත්වැඩියා කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 54. | විදුලි කණු, කොන්ක්‍රීට් ගල් නිපදවන ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 55. | ජංගම ෂෝට්ඊට්ස් අලෙවිසැල | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 56. | යුෂ නිපදවන ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 57. | සත්ව චිකිත්සාගාරය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 58. | මත්පැන නිපදවන ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 59. | ප්ලාස්ටික් වැද්දුම් වැඩ කිරිමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 60. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 61. | සිමෙන්ති ද්‍රව්‍ය නිපදවීම, විකිණීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 62. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම, විකිණීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 63. | තෙල් නිෂ්පාදනහල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 64. | ඇළුමිනියම් සවිකිරීම් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 65. | අන්තර්ජාල පහසුකම් ලබාදීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 66. | විදුලි යන්ත්‍ර හා ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 67. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු | 10,000 0 | 10,000 0 | 10,000 0 | 10,000 0 |
| 68. | පළතුරු විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 69. | එළවළු විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 70. | ස්ටිකර් වැඩබිම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| (B) | *අනතුරු රහිත වෘත්තීන් :* | | | | |
| 01. | රෙදි සාප්පු | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 02. | රෙදි මසන ස්ථානය | | | | |
| | (අ) එක් මැහුම්කරුවෙක් පමණක් | 250 0 | 500 0 | 750 0 | 1,000 0 |
| | (ආ) 2-3ත් අතර මැහුම්කරුවන් | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| | (ඇ) 3 ට වඩා වැඩි මැහුම්කරුවන් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 03. | මැහුම් යන්ත්‍ර අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 04. | පේෂ කර්මාන්ත ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 05. | යාන්ත්‍රික පේෂ කර්මාන්ත ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 06. | රන් ආභරණ සාප්පුව | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 07. | රන් ආභරණ නිෂ්පාදනය හා අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 08. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 09. | ආයුර්වේද බෙහෙත් අලෙවි ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 10. | කුළු බඩු සාප්පුව | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 11. | මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 12. | පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 13. | පාවහන් හා සම්භාණ්ඩ අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 14. | සීට් වර්ග කුෂන් කිරීමේ ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 15. | විදුලි උපකරණ අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 16. | පටිගත කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 17. | ඔරලෝසු අළුත් වැඩියා කිරීමේ ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 18. | මැටි බඳුන් විකිණීමේ ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 19. | පොත් හලක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 20. | බුලත්, පුවක්, දුම්කොළ, සුරුට්ටු විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 21. | අවමංගල්‍ය සේවාව | 3,000 0 | 3,000 0 | 3,000 0 | 3,000 0 |

| *I වැනි පේළි* | | *II වැනි පේළි* | | | |
|---|---|---|---|---|---|
| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික බද්ද* | | | |
| | | *රු. 1,500 නොඉක්මවන* | *රු. 1,501 ත් රු. 3,500 ත් අතර* | *රු. 3,501 ත් රු. 4,500 ත් අතර* | *රු. 4,501 ඉක්මවන* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 22. | මිනී පෙට්ටි විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 23. | විසිතුරු භාණ්ඩ විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 24. | කිරි සහ මුදවපු කිරි විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 25. | පුටු, මේස සහ උත්සව භාණ්ඩ කුළියට දීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 26. | පුවත්පත්, සඟරා අලෙවි ස්ථාන | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 27. | රූප රාමු කිරීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 28. | යකඩ භාණ්ඩ අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 29. | ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 30. | ඇළුමිනියම්, රිදී භාණ්ඩ විකිණීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 31. | මිරිස් එකතු කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 32. | සහල් එකතු කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 33. | තල තෙල් එකතු කිරීමේ ස්ථානය (ලීටර් 100 ට වඩා වැඩි) | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 34. | පොල් තෙල් එකතු කිරීමේ ස්ථානය (ලීටර් 100 ට වඩා වැඩි) | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 35. | සත්ව ආහාර විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 36. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 37. | තේ කොළ එකතු කිරීම සහ අලෙවි ස්ථානය (කිලෝග්‍රෑම් 250 ට වඩා වැඩි) | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 38. | කුඩා පරිමාණ කර්මාන්ත | 250 0 | 500 0 | 750 0 | 1,500 0 |
| 39. | ශබ්ද විකාශන කුළියට දීම | 250 0 | 500 0 | 750 0 | 1,500 0 |
| 40. | ඡායා පිටපත් කිරීමේ ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 41. | රියදුරු පුහුණු ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 42. | යතුරු පැදි විකිණීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 43. | පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 44. | ඇස් කණ්නාඩි අළුත්වැඩියා කිරීම් සහ අලෙවිය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 45. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 46. | රබර් මුද්‍රා තැබීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 47. | පරිගණක හා පරිගණක අමතර කොටස් අලෙවි ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 48. | හිස් ගෝනි, හිස් බෝතල් රැස්කර අලෙවිය | 250 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ලෝහ, දැව ගෘහ භාණ්ඩ අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 50. | චිත්‍රපට තැටි කුළියට දීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 51. | තීන්ත වර්ග අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 52. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 53. | මෝටර් රථ අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 54. | පා පැදි අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 55. | ජංගම දුරකථන අලෙවි සැල | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 56. | ජංගම දුරකථන අලෙවිය සහ අළුත්වැඩියාව | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 57. | මංගල්‍ය ශාලාවක් පවත්වාගෙන යාම | - | - | - | 5,000 0 |
| 58. | නවාතැන් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 59. | ධාන්‍ය වර්ග අඹුරු කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 60. | කොන්ක්‍රීට් කණු, ගල් සාදන ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 61. | පරණ යකඩ රැස්කර අලෙවි කිරීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 62. | පාර්සල් යැවීමේ සේවය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 63. | වීඩියෝ පටිගත කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 64. | මැහුම් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |

| I වන පේළි | | II වන පේළි | | | |
|---|---|---|---|---|---|
| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද | | | |
| | | රු. 1,500 නොඉක්මවන | රු. 1,501 ත් රු. 3,500 ත් අතර | රු. 3,501 ත් රු. 4,500 ත් අතර | රු. 4,501 ඉක්මවන |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 65. | පරිගණක අළුත්වැඩියා කිරීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 66. | වාහන, යන්ත්‍රෝපකරණ කුළියට දීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 67. | නොයෙක් වර්ගයේ ලුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 68. | ජිම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 69. | ප්ලාස්ටික් භාණ්ඩ තොග විකිණීම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 70. | පුද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 71. | ටයර් අලෙවි ස්ථානය | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 72. | නොයෙක් මාදිලියේ භාණ්ඩ උපකරණ විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| *(C)* | සුවිශේෂී වෘත්තීන් : | | | | |
| 01. | බැංකු වෘත්තීය | 3,000 0 | 4,000 0 | 6,000 0 | 7,500 0 |
| 02. | රක්ෂණ වෘත්තිය | 3,000 0 | 4,000 0 | 6,000 0 | 7,500 0 |
| 03. | පුද්ගලික මූල්‍ය ආයතනය | 3,000 0 | 4,000 0 | 6,000 0 | 7,500 0 |
| 04. | උකස් ගන්නා ස්ථානය | 3,000 0 | 4,000 0 | 6,000 0 | 7,500 0 |
| 05. | නොතාරිස් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 06. | සැලසුම් ශිල්ප ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 07. | කොන්ත්‍රාත්කරු | 3,000 0 | 4,000 0 | 5,000 0 | 7,500 0 |
| 08. | විගණකාධිවරු | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 09. | පුද්ගලික අධ්‍යාපන ආයතන | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 10. | ගණකාධිකාරීන් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 11. | මුදල් පොළියට දීමේ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 12. | තැරැව්කරු | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 13. | මිනින්දෝරු | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 14. | ගමනාගමන නියෝජිත | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 15. | රැකියා නියෝජිත | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 16. | විදුලි සැපයුම්කරුවන් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 17. | නල සවිකරන්නන් | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 18. | රැහැන් (කේබල්) රූපවාහිනී සේවය ලබාදෙන්නන් | 1,000 0 | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 19. | ප්‍රචාරක සේවය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 20. | පුද්ගලික පෙර පාසල් : | | | | |
| | *(අ)* සිසුන් 30 ට අඩු | 250 0 | 500 0 | 750 0 | 1,000 0 |
| | *(ආ)* සිසුන් 30 ට වැඩි | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 21. | පුද්ගලික පාසල් | 1,000 0 | 2,000 0 | 2,000 0 | 3,000 0 |
| 22. | තැපැල් සේවය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 23. | පුද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 24. | පුද්ගලික වෛද්‍ය තාක්ෂණ ස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 25. | පොදු ශාලා පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 26. | දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 27. | පාර්සල් යැවීමේ මධ්‍යස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 28. | කාය වර්ධන මධ්‍යස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 29. | ශාරීරික පුහුණු මධ්‍යස්ථානය | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 30. | පුද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 31. | පුද්ගලික ආරක්ෂක සේවාව | 3,000 0 | 3,000 0 | 3,000 0 | 3,000 0 |

## චාවකච්චේරි නගර සභාව

### සේවා ගාස්තු අයකිරීම් - 2013 වර්ෂය

